2022

වාහන වායු විමෝචන භාරකාර අරමුදල
வாகன புகை பரிசோதனை நிகழ்ச்சித் திட்டம்
VEHICULAR EMISSION TEST TRUST FUND
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
மோட்டார் வாகன போக்குவரத்துத் திணைக்களம்
DEPARTMENT OF MOTOR TRAFFIC

# වාර්ෂික කාර්යය සාධන වාර්තාව


වාහන වායු විමෝචන වැඩසටහන
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, අංක 341, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට,
කොළඹ 05.

| | |
|---|---|
| **හදිසි ඇමතුම් අංක** | **:011-3100152/ 070-3500525 (viber/Whatsapp)** |
| **ෆැක්ස්අංක** | **:011-2669915** |
| **ඊ-මෙල්** | **:dmtvet@gmail.com** |
| **වෙබ් අඩවිය** | **:www.vet.lk** |

# ප්‍රවාහන අමාත්‍යංශය

# මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

# වායු විමෝචන භාරකාර අරමුදල

# ප්‍රගතිය හා ක්‍රියාකාරී සැලැස්ම 2022

## පටුන


වාහන වායු විමෝචන භාරකාර අරමුදල හා භාරකාර මණ්ඩලය....4

හැඳින්වීම....5

අරමුණු....6

වාහන වායු විමෝචන ව්‍යාපෘති අංශයේ කාර්යභාරය....7

උපාය මාර්ග....8

සහයෝගය දක්වන ආයතන....9

සංවිධාන ව්‍යුහය....10

වාහන වායු විමෝචන ව්‍යාපෘති අංශය....11

වාහන වායු විමෝචන අරමුදලේ 2022 වර්සයට අදාල මූල්‍ය තොරතුරු - (10%) ලැබීම්....12

කොන්ත්‍රාත් ආයතන මගින් පවත්වාගෙන යනු ලබන vet මධ්‍යස්ථාන පරීක්ෂාව හා අධීක්ෂණය....14

මාර්ගස්ථ වාහන පරීක්ෂාණ වැඩසටහන (rode side trsting)....17

අධික දුම් පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන හඳුනාගැනීම සඳහා ඡායාරූප ලබා ගැනීමේ වැඩසටහන් (spotter)....18

පසු විපරම් පරීක්ෂාව....20

යුධ හමුදා හා ගුවන් හමුදා වාහන පරීක්ෂාව සහ අධීක්ෂණ වැඩසටහන....21

2022 වර්ෂයේ වාහන ගණත්වය....22

2022 වර්ෂයේ ක්ලින්කෝ ලංකා හා ලාෆ් ඉකෝ ශ්‍රී ආයතන දෙක මගින් සිදු කළ දුම් පරීක්ෂණ වලින් පළමු පරීක්ෂණය අසමත් ප්‍රතිශතය....23

වායු විමෝචන අංශයේ තාක්ෂණික ශිල්පීන් විසින් 2022 වර්ෂයේ එක් එක් මාසයන් තුළදී පරීක්ෂාවට ලක්කළ වාහන සංඛ්‍යාව....24

2022 වර්ෂයේ පරීක්ෂාවන් සිදු කළ වාහන සංඛ්‍යාවේ ප්‍රස්ථාරික නිරූපණය....25

vet වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රදර්ශන, වැඩමුළු සංවිධානය....26

යටිතල පහසුකම් සංවර්ධනය, ධාරිතාව ගොඩනැගීම, පර්යේෂණ සහ සංවර්ධනය තුළින් VET වැඩසටහනේ අපේක්ෂිත සපලතාව වැඩි දියුණු කිරීම....30

අවට වාතයේ ගුණාත්මක භාවය නිරීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා ප්‍රතිපාදන අවස්ථා ලබා දීම....31

පිරිසිදු වාහන ඇණිය, පිරිසිදු ඉන්ධන සහ ප්‍රවාහන යටිතල පහසුකම් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කිරීමට සහය වීම....32

# වාහන වායු විමෝචන භාරකාර අරමුදල හා භාරකාර මණ්ඩලය

- කැබිනට් අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ වාහන වායු විමෝචන භාරකාර අරමුදල පිහිටුවන ලදී.
- එසේම වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ භාරකාර මණ්ඩලයක් ස්ථාපිත කිරීමටත්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කාර්යාලයක් පිහිටුවීමට හා ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීමටත්, පරිසර අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රයේ උපදෙස් ලබා ගැනීමටත්, ව්‍යාපෘති කාර්යාලය උප දෙපාර්තමේන්තුවක් බවට පත් කිරීමටත් කැබිනට් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

## 2022 වර්ෂයේ වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ භාරකාර මණ්ඩලය

- නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් - මුදල් අමාත්‍යාංශය (සභාපති)
  එම්.එස්.එස්.එස්.ප්‍රනාන්දු
  ඩබ්.ඒ.සරත් කුමාර
- ලේකම් - ප්‍රවාහන අමාත්‍යාංශය
  එන්.බී.එම්.රණතුංග
  ආර්.ඩබ්.ආර්.පේමසිරි
- ලේකම් - පරිසර අමාත්‍යාංශය
  වෛද්‍ය අනිල් ජාසිංහ
- රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
  ආර්.ඒ.එස්.කේ.රණසිංහ
- කොමසාරිස් ජනරාල් - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
  එස්.සී.කේ.අලහකෝන්
  එන්.ඒ.වීරසිංහ

## හැඳින්වීම

අප අවට වායුගෝලයේ සංයුතිය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගෙනයාමේ අරමුණින් හා වායු දූෂණයට සෘජුවම හා වක්‍රාකාරව බලපාන ප්‍රධාන සාධක අතුරින් ෆොසිල ඉන්ධන දහනයෙන් මෝටර් රථ එන්ජින් වලින්, පරිසරයට එකතුවන දූෂිත වායු වර්ග ප්‍රභලව දායක වේ. මේ හේතුවෙන් පරිසරයට හා එහි වෙසෙන සියලුම ජීවීන්ට ඇතිවන හානි අවම කිරීමේ අරමුණින් ප්‍රවාහන අමාත්‍යාංශයත්, මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවත්, පරිසර අමාත්‍යාංශයත්, මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවත්, මධ්‍යම පරිසර අධිකාරියේත් සහයෝගය ඇතිව ස්ථාපනය කරන ලද ව්‍යාපෘතියකි.



## අරමුණු

වායු විමෝචන වැඩසටහන 2008 වර්ෂයේ ආරම්භ කිරීමෙන් අනතුරුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා විගණනය කිරීම් සම්බන්ධයෙන් සියළුම පාර්ශවකරුවන්ගේ එකඟතාවය මත සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුමත කරන ලදී. එම අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්, පරිසර අමාත්‍යාංශයේ ලේකම්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් යන සමාජිකයන්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් පත්කර මුදල් අමාත්‍යාංශ ලේකම් හා භාරකාර මණ්ඩල සමග අරමුදල් ගිවිසුම් ඔප්පුවක් (Deed of Trust) අත්සන් කර මෙම භාරකාර අරමුදල පහත සඳහන් අරමුණු 07 ක් සඳහා පිහිටුවා ඇත.

1. වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ කාර්යයන් පහසු කර ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුල ව්‍යාපෘති කාර්යාලය ආරම්භ කර පවත්වා ගෙන යාම.

2. එම කාර්යාලය මගින් කාර්යක්ෂම හා නිසි ප්‍රමිතීන් පවත්වා ගෙනයාම සඳහා අධීක්ෂණ හා ඇගයීම් වැඩසටහන් ක්‍රියාත්මක කර අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම.

3. මෙම වැඩසටහන අධික්ෂණය හා ඇගයීම් කටයුතු සඳහා අවශ්‍ය කරන පර්යේෂණ හා විශ්ලේෂණ සඳහා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම.

4. සම්පත්දායකවරුන්, උපදේශකවරුන්, ගණකාධිකාරි හා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ සේවය ලබා ගැනීම.

5. වායු විමෝචන වැඩසටහන කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

6. වාහන කළමනාකරණය සඳහා පහසුකම් සැපයීම වැඩිදියුණු කිරීම හා මාර්ග ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් ලබාදී අරමුණු ඉටුකර ගැනීම.

7. වායු දූෂණය අඩු කර වායු තත්වය වැඩිදියුණු කිරීමටත්, රෝග ඇතිවීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගෙන මහජනතාවගේ සාමාන්‍ය ජනජීවිතය නගා සිටුවීම.

## වාහන වායු විමෝචන ව්‍යාපෘති අංශයේ කාර්යභාරය

වාහන වලින් පිටවන දූෂ්‍යකාරක නිසා නාගරික ප්‍රදේශයන් තුල වාහන වායු දූෂණය සිදුවන බවත් එමගින් පුරවැසියන්ට හුස්ම ගැනීමට පිරිසුදු වාතය නොමැතිවීම නිසා මානව හිමිකම් කඩවන බවත් සඳහන් කර වාහන සඳහා වායු විමෝචන ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලෙස පරිසර අමාත්‍යතුමාට නියෝග කරන ලෙස ඉල්ලා ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක 569/98 දරණ පෙත්සම ගොනු කරන ලදී. එම පෙත්සම පංච පුද්ගල විනිසුරු මණ්ඩලයක් විසින් 1999 වර්ෂයේ විභාග කරන ලද අතර වාහන වායු විමෝචන ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලෙස පරිසර අමාත්‍යතුමාට නියෝග කරන ලදී.

ඒ අනුව 2000 වර්ෂයේදී වාහන වලට වායු විමෝචන ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලද අතර එම නියෝගවල වායු විමෝචන වැඩසටහන ක්‍රියාත්මක කිරිමේ බලධාරියා ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා නම් කරන ලදී. ඉන් අනතුරුව මෙම වැඩසටහන ආරම්භ කිරීම සඳහා මූලික සාකච්ජා සියළුම පාර්ශවකරුවන් සමග පරිසර අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයන්හිදී පවත්වන ලද අතර එම සාකච්ජා වලදී ගත් තීරණ අනුව භාවිතා කරන වාහන වල ප්‍රමිතිය පරික්ෂා කිරීම සඳහා සමීක්ෂණයක් පැවැත්වූ අතර එහිදී විශාල ලෙස වාහන අසමත් වූ හෙයින් ආරම්භයේදීම මෙම වැඩසටහනට මහජනතාවගෙන් විරෝධතාවයන් මතු වීම වළක්වාලීම සඳහා 2003 නව ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන ලදී. ඉන් අනතුරුව 2008 වර්ෂයේ නොවැම්බර් 17 වන දින මෙම වැඩසටහන බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කර ඇති අතර මේ වන විට සියළුම පලාත් වල ක්‍රියාත්මක කර ඇත.

2008 ජනවාරි මස 25 දින නිකුත් කරන ලද අංක 1533/17 දරණ අති විශේෂ ගැසට් නියෝගයත්, 2009 අංක 08 මෝටර් වාහන (සංශෝධන) පනත හා අංක1557/14 ජාතික පරිසර (වායු විමොචන ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) අති විශේෂ ගැසට් පත්‍රය අනුව 2008 නොවැම්බර් මස 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි වායු විමෝචන පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී.

ලියාපදිංචි වන අධික වාහන සංඛ්‍යාව හේතුවෙන් නාගරික හා අර්ධ නාගරික පෙදෙස් තුළ ඇතිවන වායු දූෂණය අවම කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ වාහන වායු විමෝචන වැඩසටහන විසින් ක්‍රියාත්මක කරනු ලබන වාහන වායු විමෝචන නියාමන වැඩසටහන් තව දුරටත් සවිබල ගන්වා ඇත.

# උපාය මාර්ග

## *අධීක්ෂණය*

- ❖ කොන්ත්‍රාත් ආයතන මගින් පවත්වාගෙන යනු ලබන VET මධ්‍යස්ථාන පරීක්ෂව සහ අධීක්ෂණ වැඩසටහන
- ❖ මාර්ගස්ථ වාහන පරීක්ෂණ වැඩසටහන. (Road Side Testing)
- ❖ අධික දුම් පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන හඳුනාගැනීම සඳහා ඡායරූප ලබාගැනීමේ Spotter වැඩසටහන
- ❖ මාර්ගස්ථ වාහන පරීක්ෂණ වැඩසටහන මගින් අසමත් වන හා අධික දුම් පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන හඳුනාගැනීමේ වැඩසටහන මගින් හඳුනා ගන්නා වාහන පසු විපරම් පරීක්ෂා කිරීමේ වැඩසටහන
- ❖ යුධ හමුදා හා ගුවන් හමුදා වාහන පරීක්ෂව සහ අධීක්ෂණ වැඩසටහන

## *ප්‍රවර්ධනය*

- ❖ VET වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රදර්ශන, වැඩමුලු සංවිධානය.
- ❖ තාක්ෂණික සහාය ශක්තිමත් කිරීම සඳහා නිසි වාහන අළුත්වැඩියා සහ නඩත්තු පහසුකම් - කාර්මික ශිල්පීන් / ගරාජ් හිමියන් පුහුණු කිරීම යනාදිය.
- ❖ යටිතල පහසුකම් සංවර්ධනය, ධාරිතාව ගොඩනැගීම, පර්යේෂණ සහ සංවර්ධනය තුළින් VET වැඩසටහනේ අපේක්ෂිත සපලතාව වැඩි දියුණු කිරීම.
- ❖ අවට වාතයේ ගුණාත්මක භාවය නිරීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා ප්‍රතිපාදන අවස්ථා ලබාදීම

## *නියාමනය*

- ❖ පිරිසිදු වාහන ඇණිය, පිරිසිදු ඉන්ධන සහ ප්‍රවාහන යටිතල පහසුකම් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කිරීමට සහය වීම.

## සහයෝගය දක්වන ආයතන

වායු විමෝචන භාරකාර අරමුදල

- වාහන දුම් පරීක්ෂණ සිදුකරන ලාෆ්ස් හා ඉකො ශ්‍රී ආයතන කළමනාකරණය.
- වාහන දුම් පරීක්ෂණ කටයුතු සිදුකිරීම.(මාර්ගස්ථ හා ස්ථානීය වශයෙන්)
- මධ්‍යස්ථාන පරීක්ෂණ කටයුතු සිදු කිරීම.

❖ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.
  - වාහන දුම් පරීක්ෂණ කටයුතු සිදුකිරීම.(මාර්ගස්ථ හා ස්ථානීය වශයෙන්)
  - මධ්‍යස්ථාන පරීක්ෂණ කටයුතු සිදු කිරීම

❖ පරිසර අමාත්‍යාංශය
  - වාහන දුම් පිලිබඳ අණ පනත් සෑදීම හා සංශෝධනය


❖ මධ්‍යම පරිසර අධිකාරිය
  - වාහන දුම් පරීක්ෂණ කටයුතු සිදුකිරීම.(මාර්ගස්ථ හා ස්ථානීය වශයෙන්)
  - මධ්‍යස්ථාන පරීක්ෂණ කටයුතු සිදු කිරීම.

❖ මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව
  - දුම් පරීක්ෂණ උපකරණ ක්‍රමාංකනය කිරීම.
  - මධ්‍යස්ථාන පරීක්ෂණ කටයුතු සඳහා සහභාගී වීම.

❖ සෞඛ්‍ය අමාත්‍යාංශය

  - වායු දූෂණයට අදාළ සෞඛ්‍ය බලපෑම් සඳහා ප්‍රතිපත්තිමය තීරණය නිරීක්ෂණය කිරීමේ වගකීම දරයි
  - වාහන විමෝචනය සම්බන්ධ සෞඛ්‍ය බලපෑම් පිළිබඳ දැනුවත් කිරීම

# සංවිධාන ව්‍යුහය


වායු විමෝචන භාරකාර අරමුදල
නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් - මුදල් අමාත්‍යාංශය (සභාපති)
ලේකම් - ප්‍රවාහන අමාත්‍යාංශය
ලේකම් - පරිසර අමාත්‍යාංශය
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
කොමසාරිස් ජනරාල් - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
ව්‍යාපෘති අධ්‍යක්ෂ
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
මධ්‍යම පරිසර අධිකාරිය
පරිසර අමාත්‍යාංශය
මිනුම් හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව
සෞඛ්‍ය අමාත්‍යාංශය
පරිපාලන නිලධාරී
ප්‍රධාන ගණකාධිකාරී
අධීක්ෂණ නිලධාරී
කළමනාකරණ සහකාර
ව්‍යාපෘති සහකාර
සංවර්ධන සහකාර
මෝටර් රථ පරීක්ෂක (වායු විමෝචන කාර්යාලය)
තාක්ෂණ ශිල්පී
කාර්යාල කාර්ය සහයක
රියදුරු

## වාහන වායු විමෝචන ව්‍යාපෘති අංශය

වාහන වායු විමෝචන ව්‍යාපෘති අංශය මඟින් සිදුකරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු හා ඒ ආශ්‍රිතව ආයතන කටයුතු සිදුකිරීම, මෙම අංශය මඟින් ඉටු වේ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවත්, පරිසර අමාත්‍යාංශයත්, මධ්‍යම පරිසර අධිකාරියත්, රජයේ කිරුම් මිනුම් දෙපාර්තමේන්තුවත් සම්බන්ධීකරණය කර ගනිමින් අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වාහන වායු විමෝචන ව්‍යාපෘති අංශය මඟින් සිදුකෙරේ.

| අනු අංකය | තනතුර | නියුක්ත ප්‍රමාණය |
|---|---|---|
| 1 | ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 |
| 2 | ගණකාධිකාරී (වැ.බ) | 01 |
| 3 | පරිපාලන නිලධාරී (වැ.බ) | 01 |
| 4 | සහකාර කොමසාරිස් (තාක්ෂණ) සම්බන්ධීකරණ | 01 |
| 5 | අධීක්ෂණ නිලධාරී | 01 |
| 6 | සංවර්ධන සහකාර | 02 |
| 7 | මෝටර් රථ පරීක්ෂක | 01 |
| 08 | ව්‍යාපෘති සහකාර / පර්යේෂණ | 01 |
| 09 | ව්‍යාපෘති කළමනාකරණ සහකාර | 02 |
| 10 | කාර්මික නිලධාරීන් | 10 |
| 11 | දෙපාර්තමේන්තු කා. කා.සහයක | 02 |
| 12 | රියදුරු | 02 |

## වාහන වායු විමෝචන අරමුදලේ 2022 වර්සයට අදාල මූල්‍ය තොරතුරු - (10%) ලැබීම්


| මාසය | ලාෆ් ඉකෝ ශ්‍රී පුද්.සමාගම | ක්ලීන්කෝ ලංකා පුද්. සමාගම | මුලු මුදල |
|---|---|---|---|
| ජනවාරි | *13,984,603.11* | *11,042,489.90* | ***25,027,093.01*** |
| පෙබරවාරි | *12,631,320.71* | *9,880,606.90* | ***22,511,927.61*** |
| මාර්තු | *13,794,835.44* | *10,797,397.31* | ***24,592,232,75*** |
| අප්‍රේල් | *9,736,057.24* | *7,797,420.45* | ***17,533,477.69*** |
| මැයි | *9,553,275.25* | *7,634,435.61* | ***17,187,710.86*** |
| ජුනි | *10,004,670.05* | *7,919,335.23* | ***17,924,005.28*** |
| ජුලි | *7,767,932.63* | *6,147,642.50* | ***13,951,575.13*** |
| අගෝස්තු | *17,512,955.54* | *14,204,209.15* | ***31,717,164.69*** |
| සැප්තැම්බර් | *14,972,074.95* | *11,923,413.76* | ***26,895,488.71*** |
| ඔක්තෝම්බර් | *13,780,937.49* | *11,335,367.73* | ***25,116,305.22*** |
| නොවැම්බර් | *13,655,651.15* | *11,408,829.55* | ***25,064,480.70*** |
| දෙසැම්බර් | *13,456,317.98* | *11,290,758.20* | ***24,747,076.18*** |
| මුලු එකතුව රු. | ***150,850,631.54*** | ***121,381,906.29*** | ***272,232,537.32*** |

# සුවිශේෂී කාර්ය සාධනය

## කොන්ත්‍රාත් ආයතන මගින් පවත්වාගෙන යනු ලබන VET මධ්‍යස්ථාන පරීක්ෂාව හා අධීක්ෂණය

වායු විමෝචන පරික්ෂණ කටයුතු කරනු ලබන කොන්ත්‍රාත්කාර සමාගම් විසින් දිවයින පුරා පවත්වා ගෙන යනු ලබන පරික්ෂණ මධ්‍යස්ථාන අපගේ කාර්යාලයේ නිලධාරින් විසින් වරින් වර පරික්ෂාවට ලක් කරනු ලබයි. එහිදී යෝජනා කැඳවීමේ ලියවිල්ලට අනුව හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්, ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ලබා දී ඇති උපදෙස් අනුව මධ්‍යස්ථාන පවත්වා ගෙන යන්නේද සහ නියමිත ප්‍රමිතියෙන් යුතුව පරික්ෂණ සිදු කරන්නේ ද පිළිබඳව සොයා බැලීම සිදු කරනු ලබයි. එසේ නියමිත ප්‍රමිතින් හා උපදෙස් අනුව ක්‍රියා නොකරන මධ්‍යස්ථාන තාවකාලිකව හා ස්ථිරව වසා දැමීමට ක්‍රියා කරනු ඇත.

**<u>Center inspection program (Auditing & Monitoring of VET centers)</u>**



2022 වර්ෂය වන විට ක්ලින්කෝ ලංකා හා ලාෆ් ඉකෝ ශ්‍රී ආයතන දෙක මගින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන අංශයේ නියාමනය යටතේ මධ්‍යස්ථාන 466ක දුම් පරීක්ෂණ කටයුතු සිදු කරන අතර එම මධ්‍යස්ථාන සත්‍යායනය කිරීම සඳහා වාහන වායු විමෝචන අංශයේ නිළධාරීන් හා මෝටර් රථ පරීක්ෂකවරුන් ඇතුලත් කණ්ඩායමක් කටයුතු කරයි.

| මධ්‍යස්ථාන වර්ගය | **ස්ථිර/ අර්ධ ස්ථිර** | **ජංගම** | එකතුව |
|---|---|---|---|
| ක්ලින්කෝලංකා | 99 | 131 | 230 |
| ලාෆ් ඉකෝ ශ්‍රී | 96 | 142 | 238 |
| **මුළු මධ්‍යස්ථාන ගණන** | **195** | **273** | **468** |

එසේම 2022 වර්ෂය වන විට රට පුරා මධ්‍යස්ථාන 204 ක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එහි තත්ව පරීක්ෂාවට අනුව ප්‍රමිතියෙන් තොරව පවත්වාගෙන යන මධ්‍යස්ථාන තාවකාලිකව වැසීමට හා අදාළ විමර්ශන කටයුතු සිදු කර ඇත.







## 2022 වර්ෂය තුළ දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන අධීක්ෂණ සාරාංශය

| මාසය | ලාශ් ඉකෝ ශ්‍රී මධ්‍යස්ථාන | ක්ලින්කෝ ලංකා මධ්‍යස්ථාන |
|---|---|---|
| ජනවාරි | 00 | 00 |
| පෙබරවාරි | 13 | 11 |
| මාර්තු | කළුතර, ගාල්ල,මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන් වල මධ්‍යස්ථාන සඳහා ඉඩම් පරීක්ෂාවන් 18ක් සිදු කර ඇත. | 00 |
| අප්‍රේල් | 14 | ගාල්ල,මාතර දිස්ත්‍රික්කයන් වල මධ්‍යස්ථාන සඳහා ඉඩම් පරීක්ෂාවන් 04 ක් සිදු කර ඇත |
| මැයි | 09 | 09 |
| ජූනි | 25 | 23 |
| ජූලි | 06 | 05 |
| අගොස්තු | 16 | 13 |
| සැප්තැම්බර් | 16 | 12 |
| ඔක්තෝබර් | 15 | 07 |
| නොවැම්බර් | 02 | 05 |
| දෙසැම්බර් | 01 | 02 |

## මාර්ගස්ථ වාහන පරීක්ෂාණ වැඩසටහන (RODE SIDE TRSTING)

මෙම වැඩසටහන මගින් මාර්ගයේ ධාවනය කරනු ලබන අහඹු ලෙස තෝරා ගෙන එම අවස්ථාවේම නවතා වායු විමෝචන ප්‍රමිතින්ට අනුකූල ද යන්න පරීක්ෂා කරනු ලබන අතර මේ සඳහා පොලිස් නිලධාරින්ගේ සහය ලබා ගනු ලබයි


**ROAD SIDE TESTING PROGRAM**




රට තුල උද්ගතව තිබූ අර්බුදකාරි තත්ත්වය හා ඉන්ධන අර්බුදය නිසා මහජනතාවට සිදු වන අපහසුතාවන් හේතුවෙන් මාර්ගස්ථ දුම් පරික්ෂණ වැඩටහන් අපේක්ෂිත මට්ටමට සාපේක්ෂව සීමා කිරිමට සිදු වූ අතර 2022 ඔක්තෝබර් හා නොවැම්බර් මාසවල පිළිවෙලින් වාහන 159 හා 153ක් ද දෙසැම්බර් මස දී බස්රථ 191 ක් ද පරීක්ෂාවට ලක් කරන ලදි..

## අධික දුම් පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන හඳුනාගැනීම සඳහා ඡායාරූප ලබා ගැනීමේ වැඩසටහන් (SPOTTER)


මෙම වැඩසටහන මගින් මාර්ගයේ අධික ලෙස දුම් නිකුත් කරනු ලබන වාහන ජයාරූප ගත කරනු ලබන අතර ඉන් අනතුරුව අදාල වාහන හිමියන් හඳුනා ගෙන ඔවුන්ට පරික්ෂා කිරීම සඳහා ස්ථානය තෝරා ගෙන දන්වා යැවීම සිදු කරනු ලබයි. එසේ දැනුම් දෙන වාහන නිසි ප්‍රමිතියෙන් ඇද්ද යන්න සම්බන්ධයෙන් පරික්ෂා කිරීම සිදු කරනු ලබයි.



මෙම ක්‍රියාවලියට අනුව 2022 වර්ෂයේ ජනවාරි සිට පෙබරවාරි දක්වා පරික්ෂාවන් 565ක් සිදු කළ අතර රට තුල උද්ගත වූ අර්බුධකාරි තත්ත්වය හේතුවෙන් මෙම පරීක්ෂා කිරීම් සීමා කිරීමට සිදු වු අතර 2022 ජූලි මස දී පරීක්ෂාවන් 90 සිදු කරන ලදි.








## පසු විපරම් පරීක්ෂාව

මාර්ගස්ථ වාහන පරීක්ෂණ වැඩසටහන ( Road Side Testing) මගින් අසමත්වන වාහන හා අධික දුම් පිටකරමින් මාර්ගයේ ධාවනය වන වාහන හඳුනාගැනීම සඳහා ඡායරූප ලබාගැනීමේ (Spotter) වැඩසටහන මගින් හඳුනා ගන්නා වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වේරහැර කාර්යාලයට රැගෙනවිත් අපගේ තාක්ෂණික ශිල්පීන් වෙතින් පරීක්ෂා කරගත යුතුය.

<u>2022 වර්ෂයේදී එවැනි පරීක්ෂා කිරීම් සිදු කළ අතර පරීක්ෂා කළ වාහන සංඛ්‍යාව පහත පරිදි වේ</u>

| මාසය | ජන | පෙබර | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාහන සංඛ්‍යාව | 69 | 295 | 121 | 19 | 10 | 16 | 17 | 28 | 22 | 23 | 10 | 11 |






## යුධ හමුදා හා ගුවන් හමුදා වාහන පරීක්ෂාව සහ අධීක්ෂණ වැඩසටහන

ශ්‍රී ලංකා යුධ හමුදාව හා ගුවන් හමුදාවට අයත් මුදල් ගෙවා දුම් පරීක්ෂාවන් සිදු නොකරන වාහන වායු විමෝචන අංශයේ තාක්ෂණික ශිල්පීන් විසින් පරීක්ෂාවටට ලක් කරනු ලබයි.

2022 වර්ෂයේදී එවැනි පරීක්ෂා කිරීම් සිදු කළ අතර පරීක්ෂා කළ වාහන සංඛ්‍යාව පහත පරිදි වේ


| මාසය | ජන | පෙබර | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාහන සංඛ්‍යාව | - | - | 1135 | 702 | - | 233 | 350 | 251 | 286 | 289 | - | 30 |









# 2022 වර්ෂයේ වාහන ගණාත්වය




## 2022 වර්ෂයේ ක්ලින්කෝ ලංකා හා ලාෆ් ඉකෝ ශ්‍රී ආයතන දෙක මගින් සිදු කළ දුම් පරීක්ෂණ වලින් පළමු පරීක්ෂණය අසමත් ප්‍රතිශතය



## වායු විමෝචන අංශයේ තාක්ෂණික ශිල්පීන් විසින් 2022 වර්ෂයේ එක් එක් මාසයන් තුළදී පරීක්ෂාවට ලක්කළ වාහන සංඛ්‍යාව

| මාසය | වාහන සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | සමත් | අසමත් | වෙනත් | මුලු ගණන |
| ජනවාරි | 60 | 4 | 5 | 69 |
| පෙබරවාරි | 225 | 64 | 6 | 295 |
| මාර්තු | 954 | 273 | 29 | 1256 |
| අප්‍රේල් | 564 | 139 | 19 | 722 |
| මැයි | 10 | 0 | 0 | 10 |
| ජූනි | 193 | 53 | 3 | 249 |
| ජූලි | 296 | 66 | 5 | 367 |
| අගෝස්තු | 253 | 26 | 0 | 279 |
| සැප්තැම්බර් | 210 | 85 | 13 | 308 |
| ඔක්තෝබර් | 361 | 134 | 13 | 508 |
| නොවැම්බර් | 112 | 51 | | 153 |
| දෙසැම්බර් | 80 | 80 | 42 | 191 |
| එකතුව | **3318** | **975** | **135** | **4407** |

## 2022 වර්ෂයේ පරීක්ෂාවන් සිදු කළ වාහන සංඛ්‍යාවේ ප්‍රස්ථාරික නිරූපණය



## VET වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රදර්ශන, වැඩමුළු සංවිධානය

වාහන වායු විමෝචන වැඩසටහන මගින් වාහන වායු විමෝචන වැඩසටහන පිළිබඳව විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරනු ලබයි. වායු තත්වය හා වාහන වායු දූෂණයෙන් පරිසරයට ඇතිවන බලපෑම පිලිබඳව, සෞඛ්‍යට ඇතිවන බලපෑම, වාහන වායු විමෝචන වැඩසටහන පිලිබඳව , ප්‍රයෝගිකව වාහන පරීක්ෂණයට ලක් කිරීම හා වාහන නිසි පරිදි නඩත්තු කිරීම වැනි කරුණු පිළිබඳව විවිධ පාර්ශවයන් සම්බන්ධ කරමින් දැනුවත් කිරීමේ වැඩමුළු සිදුකරන ලදී. මීට අමතරව අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම, රූපවාහිනී දැන්වීම් මගින්ද දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

❖ <u>පාසල් ළමුන් දැනුවත් කිරීම</u>

2022 වර්ෂයේදී පාසැල් ළමන් දැනුවත් කිරීමේ වැඩසටහන් 07ක් සිදු කළ අතර එහිදි ළමන් 740ක් දැනුවත් කරන ලදි.

| අනු අංකය | වැඩමුළුව පවත්වන ලද දිනය | වැඩසටහන පැවැත්වූ පාසල | දැනුවත් කළ ළමුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | 2022/08/30 | කොළඹ ලුම්බිනි විද්‍යාලය සහ මරදාන ගෝතමී බාලිකා විද්‍යාලය | 124 |
| 2. | 2022/09/06 | පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය | 59 |
| 3. | 2022/09/29 | හෝ/සීතාවක මධ්‍ය මහා විද්‍යාලය සහ හෝ/සිරිපියරතන මධ්‍ය මහා විද්‍යාල | 102 |
| 4. | 2022/10/07 | නු/ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය<br>තලවකැලේ සුමන මහා විද්‍යාලය | 79<br>17 |
| 5. | 2022/10/26 | මා/රාහුල විද්‍යාලය | 147 |
| 6. | 2022/11/08 | ග/බණ්ඩාරනායක විද්‍යාලය | 126 |
| 7. | 2022/12/08, 09 | වැලිමඩ මධ්‍ය මහා විද්‍යාලය<br>(VECO තාක්ෂණික ප්‍රදර්ශනය) | 200 |
| දැනුවත් කළ මුලු සිසුන් සංඛ්‍යාව | | | 740 |


උසස් පෙළ විෂය ධාරාවේ යාන්ත්‍රික තාක්ෂණවේදය හදාරන පාසැල් සිසුන්, වාහන වායු විමෝචන වැඩසටහන පිළිබද දැනුවත් කිරීම.
පළමු වැඩසටහන
දිනය : 2022/08/30
පාසල: කොළඹ 05 ලුම්බිනි විද්‍යාලය.
ආරාධිත පාසල : මරදාන ගෝතමි බාලිකා විද්‍යාලය.
ළමුන් සංඛ්‍යාව : 124


දෙවන වැඩසටහන
දිනය : 2022/09/06
පාසල: පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය.
ළමුන් සංඛ්‍යාව : 59



තුන්වන වැඩසටහන
දිනය : 2022/09/29
පාසල: අවිස්සාවේල්ල සීතාවක මධ්‍ය මහා විද්‍යාලය.
ආරාධිත පාසල : පාදුක්ක සිරිපියරතන මධ්‍ය මහා විද්‍යාලය.
ළමුන් සංඛ්‍යාව : 102


හතරවන වැඩසටහන
දිනය : 2022/10/07
පාසල: නුවරඑළිය ගාමිණි මධ්‍ය මහා විද්‍යාලය.
ආරාධිත පාසල : තලවකැලේ සුමන ජාතික පාසල.
ළමුන් සංඛ්‍යාව : 96

❖ <u>රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම</u>

| අනු අංකය | වැඩමුළුව පවත්වන ලද දිනය | දැනුවත් කළ පිරිස | දැනුවත් කළ ළමුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | 2022/09/28 | පුදුකුඩුඉරිප්පු හමුදා කඳවුරෙහි නිලධාරීන් | 110 |
| 2. | 2022/10/05<br><br>2022/10/05 | නුවරඑළිය රථ වාහන පොලිස් නිලධාරින් සහ රියදුරු සංගම් නිලධාරින්<br><br>මහජනතාවට අත් පත්‍රිකා බෙදා දීම | 84<br><br>100 |
| 3. | 2022/10/26 | මාතර රථ වාහන පොලිස් නිලධාරින් සහ රියදුරු සංගම් නිලධාරින් | 112 |
| 4. | 2022/11/09<br><br>2022/11/11 | ගම්පහ රථ වාහන පොලිස් නිලධාරින් සහ රියදුරු සංගම් නිලධාරින්<br><br>මහජනතාවට අත් පත්‍රිකා බෙදා දීම (කටුනායක මාර්ගස්ථ පරික්ෂාව) | 104<br><br>100 |
| 5. | 2022/12/13, 14 | පිටකොටුව බැස්ටියන් මාවතේ පුද්ගලික බස්රථ රියදුරන්ව සහ කොන්දස්තර මහතුන්ව දැනුවත් කිරීම | 400 |
| දැනුවත් කළ මුළු පිරිස | | | 1010 |



| දැනුවත් කළ පිරිස | සංඛ්‍යාව |
|---|---|
| පාසැල් සිසුන් සංඛ්‍යාව | 740 |
| පොලිස්/රියදුරු සංගම් නිලධාරින් | 700 |
| යුධ හමුදා නිලධාරින් | 110 |
| මහජනතාව | 200 |
| පරිසර අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලැබූ රාජ්‍ය සේවකයින් දැනුවත් කිරීම | 600 |
| මුළු එකතුව | **2350** |

**<u>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන වායු විමෝචන වැඩසටහන මගින් මෙහෙයවනු ලැබූ පාසල් ළමුන් දැණුවත් කිරීමේ වැඩමුළු සහ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු - වියදම් සාරාංශය</u>**

| | පාසල/වෙනත් | පවත්වන ලද දිනය | වියදම් වූ මුදල |
|---|---|---|---|
| 1. | කොළඹ ලුම්බිනි විද්‍යාලය සහ මරදාන ගෝතමි බාලිකා විද්‍යාලය | 2022/08/30 | රු.56,120.00 |
| 2. | පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය | 2022/09/06 | රු.26,525.00 |
| 3. | හෝ/සීතාවක මධ්‍ය මහා විද්‍යාලය සහ හෝ/සිරිපියරතන මධ්‍ය මහා විද්‍යාලය | 2022/09/29 | රු.40,700.00 |
| 4. | නුවරඑළිය රථ වාහන පොලිස් නිලධාරින්<br>රියදුරු සංගම් නිලධාරින්<br>මහජනතාවට අත් පත්‍රිකා බෙදා දීම<br>නු/ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය<br>තලවකැලේ සුමන මහා විද්‍යාලය | 2022/10/05<br>2022/10/05<br><br>2022/10/07 | රු.75,850.00 |
| 5. | මා/රාහුල විද්‍යාලය<br>මාතර රථ වාහන පොලිස් නිලධාරින්<br>රියදුරු සංගම් නිලධාරින් | 2022/10/26 | රු.98,780.00 |
| 6. | ග/බණ්ඩාරනායක විද්‍යාලය<br>ගම්පහ රථ වාහන පොලිස් නිලධාරින්<br>රියදුරු සංගම් නිලධාරින් | 2022/11/08<br>2022/11/09 | රු.83,750.00 |
| 7. | පිටකොටුව බැස්ටියන් මාවතේ පුද්ගලික බස්රථ රියදුරන්ව සහ කොන්දස්තර මහතුන්ව දැනුවත් කිරීම සහ බස්රථ පරික්ෂාව. | 2022/12/13 , 14 | රු.102,900.00 |
| | එකතුව | | රු.484,625.00 |

## යටිතල පහසුකම් සංවර්ධනය, ධාරිතාව ගොඩනැගීම, පර්යේෂණ සහ සංවර්ධනය තුළින් VET වැඩසටහනේ අපේක්ෂිත සපලතාව වැඩි දියුණු කිරීම

- වාහන වායු විමෝචන වැඩසටහනේ ඉලක්කයන් සහ අරමුණු සාර්ථක කර ගැනීමට, උපාය මාර්ගික පස් අවුරුදු සැළසුමක් Citra ආයතනය සමග එක්ව සකස් කිරීම.
- ව්‍යාපෘති කාර්යාලයේ නිලධාරීන් සඳහා ලැප්ටොප් වර්ගයේ පරිගණක මිළ දී ගැනීම සඳහා ප්‍රසම්පාදන සිදු කිරීම.
- ව්‍යාපෘති කාර්යාලය සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් මිල දී ගැනීමට ප්‍රසම්පාදන සිදු කිරීම.
- වාහන වායු විමෝචන වැඩසටහනේ නිලධාරීන් සඳහා වාහන වායු විමෝචන පරීක්ෂණය සඳහා NVQ – 4 සහතිකය ලබා ගැනීමට කටයුතු සැලසීම.
- වාහන වායු විමෝචන ක්‍රියාවලිය සහතික කිරීම සඳහා ISO 9001:2015 තත්ත්ව සහතිකය ලබා ගැනීමට අයදුම් කිරීම.

## අවට වාතයේ ගුණාත්මක භාවය නිරීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා ප්‍රතිපාදන අවස්ථා ලබා දීම

- සංසරණ වායු තත්ත්වයන් මැනීමේ කටයුතු සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා දී ඇති ස්ථිර වායු තත්ත්ව මැනීමේ ඒකක දෙක සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට ලබා දී ඇති ජංගම වායු තත්ත්ව මැනීමේ ඒකකය වෙනුවෙන් මෙහෙයුම් නඩත්තු සහ සේවා කටයුතු සඳහා ප්‍රතිපාදන ලබා දීම .



## පිරිසිදු වාහන ඇණිය, පිරිසිදු ඉන්ධන සහ ප්‍රවාහන යටිතල පහසුකම් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කිරීමට සහය වීම

1. සංසරණ වායු තත්වයෙහි වෙනස්වීම හා එම දූෂ්‍යකාරක වල සංසරණය වීම සඳහා බලපාන ප්‍රභව හා ඒවායේ ප්‍රතිවිපාක පිළිබඳව හඳුනාගැනීම සඳහා පර්යේෂණ සිදු කිරීම

2. සංසරණ වායු තත්වය මැනීම සඳහා වායු දූෂක මැනීම් සිදුකරන සෙන්සර් ආදිය භාවිතයෙන් ජාලයක් ඇති කිරීම හා මෙම දත්ත පුවත්පත් හෝ වෙනත් මාධ්‍ය භාවිතයෙන් මහජනතාවට ප්‍රදර්ශණය කිරීම

3. දැනට භාවිතා කරනු ලබන ඉන්ධන වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම හා පරිසර හිතකාමී විකල්ප ඉන්ධන ප්‍රබව ( bio-fuel, CNG, LNG ) හඳුන්වාදීමේ හා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා දායක වීම

4. පරිසර හිතකාමී වාහන තාක්ෂණය භාවිතා කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීම හා එම තාක්ෂණ ක්‍රම භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

5. වාහන කළමණාකරණ හා ගමනාගමනය කළමනාකරණ වැඩසටහන් ප්‍රවර්ධනය සඳහා දායකවීම.

6. රථ වාහන නඩත්තු කිරීම සඳහා අවශ්‍ය විසඳුම් හඳුන්වා දීම හා එම වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමට දායක වීම. මේ වන විට වාහන ගහණයෙන් විශාල ප්‍රමාණයක් මෝටර් සයිකල් වල අතර එම මෝටර් සයිකල් සඳහා බහුතරයක් භාවිතා වන්නේ කාබියුරේටරයයි. මෙම මෝටර් සයිකල් වල ඉන්ධන කාර්යක්ෂමතාව කලක් ගතවීමේදී අඩුවන අතර වායු විමෝචනයද වැඩිවේ. එම නිසා EFI තාක්ෂණය සහිත මෝටර් සයිකල් භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සඳහා දායක වීම සහ ඩීසල් ට්‍රක් රථ හා බස්රථ සඳහා වැඩි ඉන්ධන කාර්යක්ෂමතාවයක් සහිත එන්ජින් මාදිලි හඳුන්වා දීම

# මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
# වාහන වායු විමෝචන භාරකාර අරමුදල
# 2022

**සකස් කළේ :-.....................................**

**පරීක්ෂා කළේ :-.....................................**

**සංඛ්‍යාත්මක දත්තයන් - වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලය / පරිසර අමාත්‍යාංශය**
**2023.10.05**